**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතද අනුගමනය කර තිබුණද සමාගම් විසින් අනුගමනය කරන ලද පදනම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම හෙළිදරව්කර නොතිබුණි. | පිළිගනිමි. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | සමාගම් විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රමිත හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව ප්‍රමාණාත්මක පූර්ව කාල පරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවද මොරගහකන්ද ජල විදුලිබලාගාරවලින් පෙර වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු. | පෙර වර්ෂයට වන ගැලපිම මත ලාභයට සිදුවන බලපෑම 2020 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනම පෙන්විමට කටයුතු කරමි. | පූර්ව කාල පරිච්ඡේද වැරදි අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | **496,770,000** ක ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමේදී එලෙස සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **01** ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. **210,567,000** ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කළ ආකාරය සහ ඊට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක **01** ප්‍රකාරව පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කල ආකාරය පිළිබඳ සටහනක් **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරිමට කටයුතු කර ඇත. | තොග අගයකිරීමේ විස්තර සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **07** හි **49** වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාල දේපල පිරියත හා උපකරණ පංතියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද, **2019** ජනවාරි **01** දින සිදුකර තිබුණු අධිකාරියේ මෝටර් රථ ප්‍රත්‍යාගණනයේදී ප්‍රමිතයේ නියමයන්ට පටහැනිව නඩත්තු අංශයේ සහ ප්‍රධාන කාර්යාලයේ පැවති පිලිවෙලින් පිරිවැය රු. **175,599,150** ක් හා රු. **60,648,350** ක් වූ මෝටර්රථ ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනෙකුත් කාර්යාලවලට සාපේක්ෂව ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ කාර්යභාර ඉංජිනේරු කාර්යාල දිස්ත්‍රික්ක කිහිපයකට ව්‍යාප්තව ඇති අතර, මෝටර් රථ ප්‍රත්‍යාගණනය සඳහා එම දිස්ත්‍රික්කවල මෝටර් රථ පරීක්ෂක මහතුන් සහභාගී කරවා ගත යුතුවේ. ඔවුන් සහභාගි කරවා ගැනීමට ඔවුන්ගේ රාජකාරි බහුලත්වය මත අපහසු විය. කෙසේ නමුත් මේ වන විට සියළුම කාර්යභාර ඉංජිනේරු කාර්යාලවල ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ඇත. ඒ අනුව **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව නිවැරදි කිරීම කල යුතුය |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **07** හි **47** ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකිය යුතු තරම් වෙනස්වන හා ඉක්මනින් වෙනස්වීම්වලින් යුක්තවන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කළයුතු වුවත්, අධිකාරිය විසින් **1984 - 1989** කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.**64,320,853** ක් වූ ඉඩම් කට්ටි **02** ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ඒවායේ පිරිවැය හෝ ගිණුම්ගත කර නොතිබුණි. | මහවැලි අධිකාරිය විසින් වටිනාකම රු.**64,320,853** කට මිල දී ගත් කොළඹ **10**, ටී.බී.ජයා මාවතේ අංක **500**, හා අංක **493** දරන ඉඩම් කට්ටි **02** හි තක්සේරු වටිනාකම ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එම තක්සේරු වටිනාකම් ලද පසු ගිණුම් ගත කිරිමට කටයුතු කරමි. | අධිකාරියට අයත් වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි. | 2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ මේ පිළිබඳ හෙළිදරව් කර ඇති අතර එලෙස ගිණුම්ගත කිරීමට කලාපය / අංශ දැනුවත් කිරීමට ද කටයුතු කරනු ඇත. | පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදිය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සටහන් අනුව රු බිලියන 82.61 ක පිරිවැය වූ ප්‍රධාන වේලි 12 ක් සහ කි.මී 919 ක ප්‍රධාන ඇලමාර්ග, කි.මී 7,789 ක සෙසු ඇල මාර්ග, වැව් 463 ක් හා කි.මී 1,127.5 ක පාරවල් මහවැලි අධිකාරිය විසින් නඩත්තු කරමින් පැවතියද එම වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම 2018 දෙසැම්බර් 21 දින අධිකාරිය විසින් භාරගෙන තිබුණු මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රධාන ඇල වේලි, ඇල මාර්ග, සෙසු ඇල මාර්ග හා වැව් වල පිරිවැය රු.බිලි: 82.61 ක් වශයෙන් 2019 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති සටහන්වල දක්වා ඇත. එම වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුකර ගැනීමට නොහැකි වන්නේ නම්, එය මා විසින් පත් කරනු ලබන වරලත් ඉංජිනේරුවන් හා වරලත් තක්සේරුකරුවගෙන් සමන්විත අභ්‍යන්තර කමිටුවක් මඟින් තක්සේරු කර ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කිරීමට කටයුතු කරමි. මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දී තිබූ රු. 49,106,673,124 ක මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ වත්කම් හා ඊට අදාල ක්ෂය සමඟ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | අධිකාරියට අයත් වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **2015 – 2018** කාලය තුළ රු. **80,000,000** ක වියදමින් වැලිකන්ද සහ වැලිඔය කලාපවල ඉදිකර තිබුණු ජලපිරිපහදු යන්ත්‍ර **30** ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ “එල් කලාපය ” හා “බී කලාපය” තුල ඉදි කරන ලද රු. මි. **80** ක් වටිනා ජලපිරිපහදු යන්ත්‍ර **30** , ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දී ඇත. **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමට කටයුතු කරමි. | අධිකාරියට අයත් වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය විසින් අධිකාරියට ඉදිකරදී තිබූ පිරිවැය රු. **499,421,968** ක් වූ කොත්මලේ හා පොල්ගොල්ල කාර්යාල ගොඩනැගිලි අධිකාරිය විසින් **2019** වර්ෂයේ සිට භාවිතායට ගෙන තිබුණද, එම කාර්යාල ගොඩනැගිලි අධිකාරියේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොල්ගොල්ල හා කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලවල ඉදිකරන ලද ගොඩනැගිලි වල වටිනාකම් **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් කිරීමට කටයුතු කරමි. | අධිකාරියට අයත් වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලි බලාගාරවලින් ලැබිය යුතු රු. **22,557,702** ක රාජ්‍ය භාග ආදායම ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අවසන් ගිණුම් පිළියෙල කරන අවස්ථාවේ දී කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වලින් ලැබිය ආදායම් ලෙස රුපියල් **65,017,306.02** ක මුදලක් සටහන් කල අතර විදුලිබල මණ්ඩලය විසින් ගෙවීම් කිරීමේ දී රුපියල් **81,836,484.32** ක මුදලක් ලැබී ඇත. එම වෙනස **2020** වර්ෂයේ දී ජ’නල් සටහනක් මඟින් දැනටමත් නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වැඩ අවසන් කර නොතිබුණු වලව කලාපයේ මුරවැසිහේන කොට්ඨාස කාර්යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දරා තිබුණු රු. **3,518,278** ක මුදල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වියදමක් ලෙස කපාහැර තිබුණි. | මුරවැසිහේන කොට්ඨාශ කාර්යාලය මේ වන තෙක් ද ඉදිකර අවසන් වි නොමැත. එබැවින් එම වියදම් ප්‍රග්ධන නොනිම් වැඩ ලෙස දක්වා ඇත. **2020** වර්ෂයේ දී නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මඟින් අධිකාරිය වෙත ලබා දී තිබුණු වත්කම්වල තක්සේරු වටිනාකම රු. **14,040,500** ක් වුවද එය රු. **26,533,300** ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. තවද රු. **1,800,000** ක් වූ වත්කමක් රු. **18,000,000** ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම හේතු නිසා දේපළ පිරියත හා උපකරණ රු. **28,692,800** කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | **2020** වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු. **671,503,748** ක් වූ ස්ථාවර වත්කම් කොටසක් රු. **478,699,000** කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගතකර තිබුණද ඉතිරි වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. එසේම මෙම වත්කම්වල වටිනාකම ප්‍රදානයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, ණයහිමියන් යටතේ රු. **398,346,892** ක් ලෙස රු. **80,352,108** ක් අඩුවෙන් වගකීම්වලට එකතු කර තිබීම නිසා ප්‍රදානය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ කළමනාකරණ පහසුකම් යටතේ විවිධ කොන්ත්‍රාත්වලින් අධිකාරියට ලැබී තිබුණු රු. **4,369,384** ක වත්කම්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ව්‍යාපෘතිය මඟින් ලබා දී ඇති වත්කම්වල ණයහිමියන් ලෙස දක්වා ඇති වටිනාකම රු. **398,346,892** හා ප්‍රත්‍යාගණිත වටිනාකම රු. **478,699,000** අතර වෙනස රු. **80,352,108** ක් වූ වටිනාකම අදාල කලාප වෙත දැනුවත් කර එය නිවැරදි කර **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කරමි. මෙම ව්‍යාපෘතිය මඟින් විවිධ කොන්ත්‍රාත්වලින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබා දී ඇති රු.**4,369,384** ක වත්කම් අධිකාරිය වෙත විධිමත් පරිදි වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මඟින් භාර දී නොමැති බව දන්වමි. | වත්කම් විධිමත් පරිදි භාරගෙන ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඌ) | අධිකාරියේ දේපල පිරියත හා උපකරණ ක්ෂය ප්‍රතිපත්තියට අනුව මෝටර් රථ ක්ෂය කළ යුත්තේ සියයට **10** ක සුන්බුන් අගයක් අඩුකිරීමෙන් පසුව වුවද, කලාප **6** ක් විසින් එසේ සිදුකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු. **6,116,990** ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කලාප **06** ක මෝටර් රථ ප්‍රත්‍යාගණනය සිදු කර එම වටිනාකමෙන් ක්ෂය වීම් අඩු නොකර වටිනාකම ගිණුම් ගත කර ඇති බැවින් එම දෝෂය නිවැරදි කර **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිකිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4** නොසැසඳුන පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජන වටිනාකම | **413,981,000** | **416,132219** | **2,151,219** | **2019.12.31** මහවැලි පශු සම්පත් සමාගම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව වෙනස රු. **2,151,219** ක් වේ. එම වෙනසට හේතු වූ කරුණු හඳුනාගෙන **2020** වර්ෂයේ නිවැරදි කර ඇත. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| පාරිතෝෂික වෙන්කිරීම - මහවැලි ආරක්ෂක බලකාය | **266,401,977** | **266,561,977** | **160,000** | මහවැලි ආරක්ෂක බලකායේ මූල්‍ය ප්‍රකාශණයේ හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ පාරිතෝෂිත වෙන්කිරීම අතර එවැනි වෙනසක් නොමැත. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| පුනරාවර්තන වියදම - මහවැලි ආරක්ෂක බලකාය | **488,250,509** | **471,290,659** | **16,959,850** | මහවැලි ආරක්ෂක බලකායේ මූල්‍ය ප්‍රකාශනයේ හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ පුනරාවර්තන වියදම් අතර එවැනි වෙනසක් නොමැත. | වෙනස්කම් පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| ප්‍රාග්ධන වියදම - මහවැලි කේන්ද්‍රය | **6,662,000** | **5,908,943** | **753,057** | මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය ට අදාලව "කෘෂිකර්ම" ගිණුම් කේතය යටතේ වූ රු.**753,510** වැරදීමකින් මහවැලි කේන්ද්‍රය යටතේ පෙන්වා තිබුණි. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ලැබිය යුතු ගිණුම් මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය | 1,016,163,953 | 1,014,922,181 | 1,241,772 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු ගිණුම් යටතේ හදුනාගත නොහැකි ශේෂය වූ රු. 1,240,772 ක් පෙන්වා ඇති අතර මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය මූල්‍ය ප්‍රකාශනයේ එම මුදල ජංගම වත්කම් යටතේ වෙනම පෙන්වා ඇත. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| මෝටර් රථ ක්ෂය - හුරුළුවැව | 5,475,240 | 5,817,240 | 342,000 | හුරුළුවැව කලාපය මගින් වැරදිමකින් ගංගා ද්‍රෝණි කළමණාකරණ අංශය වෙත එවන ලද සමුච්චිත ක්ෂය වූ රු.342,000 ක් වර්ෂයේ ක්ෂය වීම් ලෙස දක්වා ඇත. එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| ගොවිපල ලාභ/අලාභ - එල් කලාපය | 2,197,000 | 1,789,000 | 408,000 | එල් කලාපයේ මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ නිවැරදිව රු. 2,197,121 දක්වා ඇත. නමුත් ගොවිපල ලාභ ලාභ ගිණුම පිළියෙල කිරිමේදි ජෛව වත්කම් වෙනස ගැලපුම් කර නොතිබුණි. එය නිවැරදි කර ඇත. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.5 අවිනිශ්චිත ගිණුම්

| විෂයය | මුදල | අවිනිශ්චිතව තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | 13,010,825 | අවු 05 | රු. මිලියන 33 ක පමණ ශේෂය වර්තමානය වන විට රු. මිලියන 13 දක්වා නිවැරදි කර ගැනිමට හැකි වී ඇත. මෙම වර්ෂයේදී රුපියල් මිලියන 1 ක පමණ ශේෂයන් නිවැරදි කර ගැනිමට හැකිවී ඇත. ඉදිරියේදි මෙම ශේෂය නිවැරදි කර ගැනිමට කටයුතු කරන බව දන්වා සිටින අතර 2020 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම පෙන්වීමට ද කටයුතු කරමි. | හඳුනා නොගත් ගිණුම් නිරවුල් කිරීමට පියවර ගතයුතුය. |

### 1.5.6 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (අ) වගන්තිය ප්‍රකාරව විගණනය වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. මෙම නිසා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කිරීමේදී විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | සමාගම සඳහා මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැති අතර රේඛීය අමාත්‍යංශයේ ලේකම් විසින් සමාගමේ කටයුතු කරගෙන යාම සඳහා " නිසි බලධාරියෙකු" පත්කර ඇත. එහෙත් මෙම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (අ) වගන්තිය ප්‍රකාරව 2020 ජුනි මස 24 වන දින විගණනය වෙත මූල්‍ය වාර්තා ඉදිරිපත් කල ද එම මූල්‍ය ප්‍රකාශන "නිසි බලධාරියාගේ"අනුමැතියෙන් භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇත. තවද මූල්‍ය ප්‍රකාශන විගණනය කළ හැක්කේ අධ්‍යක්‍ෂක මණ්ඩලයක් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන පමණක් බව 2020 ජූලි මස 17 වන දින අප වෙත ලිඛිතව දන්වන ලදී. ඒ අනුව අප සමාගමේ අධ්‍යක්ෂකවරු මේ වන විටත් පුරප්පාඩුව පවතී. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී පරිපාලිත සමාගම්වල විගණිත මූල්‍ය ප්‍රකාශන යොදාගත යුතුය. |

**1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අයෝජන | රු. 20,477,000 | කොටස් සහතික | මේ පිළිබඳ සොයා බලා ඉදිරියේ දී ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | අදාල ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ආ) | ඉතිරි කිරීමේ ගිණුම | 2,632,908 | ශේෂ සනාථන සහ පාස්පොත | -එම- | -එම- |
| (ඇ) | ස්ථාවර තැන්පතු | 727,481 | තැන්පත් සහතික ශේෂ සනාථන | -එම- | -එම- |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාවත්ත පරිශ්‍රයේ පිහිටි බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 13 ක් සඳහා තක්සේරු වාර්තා අනුව අයකර ගතයුතු කුළිය අයකර ගන්නා ලෙස දන්වා තිබුණද, රු.70,224,000 ක් 2019 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන නොතිබුණි. අධිකාරිය විසින් එම ගොඩනැගිලි වෙනුවෙන් විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා තිබුණු රු.27,027,871 ක් අදාල පාර්ශව වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | ආයතන වෙත ප්‍රතිපූර්ණය කිරිමට වරින් වර දන්වා ඇත. මෙම ප්‍රතිපූර්ණය නොකිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙම වටිනාකමින් රු. 3,472,883 ක මුදලක් 2020 වර්ෂයේ දී ලැබී ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 24 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.3.3 ඡේදය | නිලධාරියෙක් ව්‍යාපෘතියකට නිදහස් කළ හැක්කේ රජයේ අවශ්‍යතාවය මත පූර්ණකාලීන පදනමින් අවුරුදු 05 ක් හෝ වැටුප් රහිත පදනම මත | මොරගහකන්ද-කළුගඟ ව්‍යාපෘතිය වෙත මුල් කාලයේදී අධිකාරියේ නිලධාරීන් නිදහස් කිරීමේදී එය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහනක් ලෙස සළකා නිලධාරීන් අනුයුක්ත කර ඇත. | ව්‍යාපෘති සඳහා සේවකයන් නිදහස්කිරීමේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවකයාගේ ඉල්ලීම අනුව අවුරුදු 05 ක් සඳහා පමණි. නමුත් අධිකාරියේ නිලධාරීන් 37 දෙනෙකු වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ ව්‍යාපෘතිවල සේවය කර තිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ ස්ථිර තනතුර දීර්ඝ කාලයක් පුරා පුරප්පාඩුවී පැවතුණි. තවද නිලධාරීන් 33 දෙනෙකු මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ සේවය සඳහා ස්ථාන මාරු යටතේ පූර්ණකාලීන වැටුප් සහිතව අනුයුක්ත කර තිබුණි. | නමුත් පසුකාලීනව උක්ත ව්‍යාපෘතිය වෙත නිලධාරීන් නිදහස් කිරීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 හි විධිවිධානයන්ට අනුව අදාල නිලධාරීන්/සේවකයින් නිදහස් කිරීම සිදුකරන ලදී. මොරගහකන්ද-කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු අවසන් වීමේ ස්වභාවය අනුව සේවා අවශ්‍යතාවය ඉක්මවා පවතින අතිරික්ත කාර්යමණ්ඩල නැවත අධිකාරිය වෙත අනුයුක්ත කිරීමට කටයුතු කරමි. එසේම වර්ෂ 05 ඉක්මවා ඇති සෙසු ව්‍යාපෘති කාර්ය මණ්ඩල මේ වන විට නැවත අධිකාරී සේවයට කැඳවීම සිදු කරමි. ඒ අනුව ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කලමනාකරණ නව ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු වෙනුවෙන් රැඳී සිටි කාර්ය මණ්ඩලය නැවත අධිකාරි සේවයට කැඳවන ලදි. එමෙන්ම දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ සේවයේ නියුතු වර්ෂ 05 ඉක්මවා ඇති කාර්ය මණ්ඩල ද මේ වන විට නැවත කැඳවීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. | |
| (ආ) | අධිකාරියේ මූල්‍ය කාර්යපරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ 02/2012 හා 2012 මාර්තු 15 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වගන්තිය | අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය අවසන් වී දින 07 ක් ඇතුලත පියවියයුතු වුවද කලාප 10 ක හා අංශ දෙකකට අදාල වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ රු.167,329,000 ක සැපයුම් අත්තිකාරම් විය. | මෙම ශේෂයන් පිළිබඳ කලාපයෙන්/අංශයෙන් උපලේඛන ලබා ගෙන ගිණුම්කරණ දෝෂයක් වේ නම් ඒ අනුව නිවැරදි කිරිමටද, ලැබිය යුතු ශේෂයන් පිළිබඳ අදාල ආයතන හා පුද්ගලයන්ට ලිපි මඟින් දන්වා අය කර ගැනිමටද, යම් ගිණුම්කරණ දෝෂයක් වේනම් එය නිවැරදි කිරිමටද කටයුතු කරනු ඇත. | අධිකාරියේ මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය ප්‍රකාරව සහ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ **2017** දෙසැම්බර් **21** දිනැති අංක **2/2017** දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | | | |
| | **(i)** **2** වගන්තිය | රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනයේ නමින්ම ලියාපදිංචි කර තිබීම අනිවාර්ය වුවත්, අධිකාරිය විසින් භාවිතා කරන රජයට අයත් වාහන **56** ක් අධිකාරියේ නමින් ලියාපදිංචි කර නොතිබුණි. | මහවැලි කලාප තුල කටයුතු කරන ලද විදේශ ආයතන ව්‍යාපෘති සඳහා ගෙන්වන ලද තීරු බදු නිදහස් වාහන එම ව්‍යාපෘති අවසන් වූ පසු අධිකාරිය වෙත භාර දී ඇත අමාත්‍යාංශ සතු එම වාහන පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. මෙම තීරුබදු නිදහස් කරන ලද වාහන අප වෙත පවරා ගැනිමේ දී ශ්‍රී ලංකා රේගුව වෙත තිරු බදු ගෙවිය යුතුය. බදු ගෙවා මෙම වාහන පවරා ගැනීම ආර්ථික වශයෙන් ලාභදායි නොමැත. එම වාහන පවරා ගැනීමේ දී ගෙවිය යුතු තීරු බදු රේගු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර බදු ඉවත් කරගෙන අධිකාරිය නමින් ලියාපදිංචි කර ගැනීමේ කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරියේ සියළුම වාහන අධිකාරිය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| | **(ii)** **2.3** (අ)සහ (ආ) වගන්ති | රජයේ ආයතනවලට පරිත්‍යාග වශයෙන් ලැබී ඇති වාහන සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා බදු රහිතව ආනයනය කර ඇති වාහන භාවිතා කිරීමේදී ලියාපදිංචි අයිතිය ලබාගැනීමට කටයුතු කළයුතු වුවත්, එසේ බදු රහිතව ආනයනය කර තිබුණු වාහන **16** ක ලියාපදිංචි අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි. | මෙම වාහන අධිකාරිය වෙත පවරා ගැනීමේ දී විශාල බදු මුදලක් ගෙවීමට සිදුවන බැවින් මේ පිළිබඳ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කර ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ **2018** මාර්තු **19** දිනැති අංක **1/2018** දරන | ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියළුම වාහන **2018** ජුනි **30** දිනට පෙර අපහරණය කළ යුතු | අධිකාරියට අයත් ධාවනය කළ නොහැකි තත්වයේ පවතින සියළුම වාහන **2018** වර්ෂය වන විට අපහරණය කිරීමට | චක්‍රලේඛය ප්‍රකාරව කඩිනමින් අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ **2** ( ආ) වගන්තිය | වුවත් අධිකාරිය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | නොහැකි විය. අධිකාරියට අයත් සියළුම කලාප/අංශවලට අයත් ධාවනය කළ නොහැකි තත්වයේ පවතින වාහන මේවන විට අපහරණය කිරීම සඳහා තක්සේරු කිරීමට කමිටුවක් පත් කර කටයුතු කෙරෙමින් පවතී. ඒ අනුව මෙම වර්ෂය අවසාන වන විට මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කර අවසන් ගිණුම් වලට ගැලපීමට කටයුතු කරමි. | |
| (ඉ) | **1947** අංක **8** දරන රජයේ ඉඩම් ආඥා පනතේ **217 (2) (vi)** වගන්තිය | වාණිජ හෝ කාර්මික කටයුතු සඳහා ඉඩම් බදු දීමේදී වෙළඳපළ වටිනාකම තක්සේරු කර බදු මුදල් අයකළ යුතු වුවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශය තුල ඉඩම් කැබලි **18** ක් කළුගල් කැඩීම සඳහා බදු පදනමට බැහැර කර තිබුණද **2020** පෙබරවාරි **27** වූ විගණිත දිනය දක්වා එම කිසිදු ඉඩමක් මැනීම් කර ඒවායේ රජයේ තක්සේරු අගය මත බදු මුදල් අයකර නොතිබුණි. | මහවැලි එච් කලාපය තුල ක්‍රියාත්මක කළුගල් කැනීම් ව්‍යාපෘති භූමි වර්ෂ ගණනාවකට පෙර සිට අධිකාරියේ විධිමත් අනුමැතිය සහිතව බදු පදනම යටතේ මෙන්ම විධිමත් අනුමැතියකින් තොරව ද ව්‍යාපෘතිකරුවන් වෙත ව්‍යාපෘති සිදු කිරීම සඳහා බැහැර කිරීම සිදු කර ඇත. එබැවින් එම ව්‍යාපෘති භූමි අදාල ව්‍යාපෘතිකරුවන්ගේ පෞද්ගලික වියදමින් අනුරේඛන සකස් කර ඉදිරිපත් කරන ලෙස ව්‍යාපෘතිකරුවන් දැනුවත් කර ඇත. අදාල අනුරේඛන ලැබීමෙන් පසු අදාල ව්‍යාපෘති භූමි සඳහා රජයේ තක්සේරුව ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව අනුරාධපුරය වෙත යොමු කර ඇත. තක්සේරු දෙපාර්තමේන්තු වෙතින් අදාල තොරතුරු මේ වනතුරු ලැබී නොමැති අතර අදාල තක්සේරු වටිනාකම ලැබීමෙන් පසු ව්‍යාපෘතිවලට අදාල බදු මුදල් ගණනය කර හිඟ බදු මුදල් අය කර ගැනීම සඳහා කටයුතු සිදු කරමි. | **1947** අංක **8** දරන රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාරව කටයුතු කර අදාල බදු නියමිත පරිදි අය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) **2019** මාර්තු **21** දිනැති අංක **LUP/01/01/2019** දරන මහවැලි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය | | | |
| **(i)** උපලේඛන **(i)** හි **1.6** වගන්තිය | භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ගෙවනු ලබන කැනීම් පරිමාව මත පදනම්ව ඉඩම් පරිහරණ ගාස්තු අය කළ යුතු වුවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් එලෙස සිදුකර නොතිබුණි. භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයට රාජ්‍ය භාගය ගෙවන ලද කැනීම් ප්‍රමාණයන් සහතික කරගැනීමකින් තොරව බලපත්‍රලාභියා විසින් ඉල්ලුම්කරන කියුබ් ප්‍රමාණය සඳහා පමණක් ඉඩම් පරිහරණ ගාස්තු අයකර තිබුණි. | එච් කලාපය තුල ක්‍රියාත්මක කැනීම් ව්‍යාපෘතිවලට අදාල කැනීම් පරිමාවන් පිළිබඳව තොරතුරු ලබා දෙන මෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් ලිපි මගින් ඉල්ලීම් කර ඇති අතර එම තොරතුරු ලද පසු එම හිඟ බදු මුදල් ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කැනීම් ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගැනීමට සහ නිසි පරිදි ඉඩම් පරිහරණ ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** උපලේඛන **(i)** හි **1.8** වගන්තිය | කැනීම් සිදුකරන ලබන ස්ථාන අඛණ්ඩව අධීක්ෂණය සඳහා කොට්ඨාශ මට්ටමින් නිරීක්ෂණ කමිටු පත්කිරීම හා සති **2** කට වරක් ක්ෂේත්‍රය නිරීක්ෂණය කර දිනකට නිස්සාරණය කරනු ලබන ඛනිජ ප්‍රමාණය ඇතුළත් නිරීක්ෂණ වාර්තා අධ්‍යක්ෂ ( ඉඩම් පරිහරණ සැලසුම්) වෙත යොමුකිරීම් කල යුතු වුවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් එපරිදි කටයුතු සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර චක්‍රලේඛ අංක **LUP/01/01/2019 – (i) – 1.8** වගන්තිය අනුව ව්‍යාපෘති භූමි සම්බන්ධව කොට්ඨාස මට්ටමින් නිරීක්ෂණ වාර්තා මා වෙත ලබාදෙන ලෙස අදාල කොට්ඨාස කලමණාකරුවන් දැනුවත් කර ඇත. මෙම කැනීම් කටයුතු සම්බන්ධ විද්‍යාත්මක හා විශේෂඥ දැනුම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතුව ඇත. එච් කලාපය තුල ක්‍රියාත්මක කැනීම් ව්‍යාපෘතිවලට අදාල කැනීම් පරිමාවන් පිළිබඳව තොරතුරු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් | චක්‍රලේඛය ප්‍රකාරව මනා අධීක්ෂණයක් සිදුකරමින් අදාල වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉල්ලා ඇත. තොරතුරු ලැබීමෙන් පසු නිස්සාරණය කරනු ලබන ඛනිජ ප්‍රමාණය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ හා සැලසුම්) වෙත යොමු කරන බව නේවාසික ව්‍යාපාර කළමණාකාර එච් කලාපය මා වෙත වාර්තා කර ඇත. | |
| (උ) | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ **2020** ජනවාරි **03** දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක **01/2017(1)** | රජයේ ආයතන විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු **2019** දෙසැම්බර් **31** දිනට යාවත්කාලීන කර **2020** ජනවාරි **20** දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළයුතු වූවත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එච් කලාපය, ඊ කලාපය, මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය හා එල් කලාපය විසින් ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි ඊ කලාපය හා ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අදාල තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත මේ වන විටත් යොමුකර ඇත. අනෙකුත් කලාප **02** වන එච් කලාපය හා එල් කලාපය වෙතින් මෙම තොරතුරු කඩිනමින් ලබා ගෙන කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ **2018** දෙසැම්බර් **31** දින නිකුත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශයේ **2.1** ඡේදය | රජයට අයත් සියලුම ඉඩම් තක්සේරු කිරීම අත්‍යාවශ්‍ය වන අතර, එහිදී රජයේ කාර්යාල, නිවාඩු නිකේතන, වැඩපලවල් ආදිය පිහිටා ඇති රජයේ ඉඩම් තක්සේරු කර ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වූවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාල, නිවාඩු නිකේතන හා වැඩපලවල් ආදිය පිහිටි ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි තක්සේරු කර මූල්‍ය වාර්තා වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මාර්ගෝපදේශය ප්‍රකාරව අදාල ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(එ) 2017 මැයි 09 දිනැති අංක ඩීජී/05/2017** දරන මහවැලි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය<br>(I) ඒ **- 3** හා සී **- 1** වගන්ති | තලාව කොට්ඨාස කාර්යාලය විසින් නිල නිවාස හා ගොඩනැගිලි කාණ්ඩගත කර ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. පවත්වාගෙන යාම ආර්ථික වශයෙන් ඵලදායී නොවන නිවාස හෝ ගොඩනැගිලි නිසි පරිදි හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. අත්හැර දමන ලද නිල නිවාස **4** ක් දක්නට තිබුණි. | කොට්ඨාස කාර්යාලයේ නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි සඳහා වෙන වෙනම ලිපිගොනු පවත්වා ගෙන යනු ලැබේ. පවතින ප්‍රතිපාදන සීමාවන් නිසා වර්ෂ ගණනාවක සිට නිල නිවාස අලුත්වැඩියාව සඳහා ප්‍රමානවත් ප්‍රතිපාදන ලබා දීමට නොහැකිවීම හේතුවෙන් අලුත්වැඩියා කටයුතු කිරීමට නොහැකි වී ඇත. එබැවින් අබලන් තත්ත්වයට පත් වී ඇති බව පිළිගනිමි. භාණ්ඩාගාරය වෙතින් අධිකාරිය වෙත ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන ලබා දෙයි නම් මෙම නිල නිවාස අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි බව ද දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කාණ්ඩ අනුව ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තුකිරීමට කටයුතු කළ යුතු අතර නිල නිවාස ඵලදායී ලෙස භාවිතා කළ යුතුය |
| (II) බී**- 1** වගන්තිය | බාහිර පාර්ශවයන් වෙත නිල නිවාස ලබාදීමේදී කුලී හෝ බදු පදනම මත විධිමත්ව හා ගිවිසුම්ගතව පමණක් ලබාදිය යුතු වුවත් තලාව කඳවුරේ නිල නිවාස **6** ක් බාහිර පාර්ශවයන් වෙත ගිවිසුම්ගත වීමකින් තොරව ගාස්තු රහිතව ලබා දී තිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාවේදී ඉන් එක් නිල නිවාසක් මහවැලි අධිකාරියේ අවසරයකින් තොරව අළුත්වැඩියා කරමින් පැවතුණි. | නිල නිවාස **05** ක් තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති බව වත්කම් ලේඛනයේ සඳහන් වේ. විධිමත් අනුමැතියකින් තොරව තැපැල් දෙපාර්තමේන්තුවට ලබා දි තිබූ අලුත්වැඩියා කරමින් පැවති නිල නිවාස පිළිබඳ ව තලාව පොලිසිය වෙත පැමිණිලි කර ඇති අතර එම අලුත්වැඩියා කටයුතු මේ වන විට නවතා දමා ඇත. අනෙක් නිල නිවස අධිකාරිය සතු වන අතර එය පොලිස් ස්ථානාධිපති (තලාව) විසින් භාවිතා කල ද මේ සඳහා මුදල් අයවීමක් සිදු නොවන බවද දන්වමි. තවද බාහිර පාර්ශවයන් වෙත නිවාස ලබා දීමේදී විධිමත් ගිවිසුම් නොමැති ගොඩනැගිලි සඳහා විධිමත් ලෙස ගිවිසුම් ගත විම සඳහා අදාල ගිවිසුම් පිළියෙල කර පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව ගිවිසුම් ගත වීමට කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි ජනපදිකයින්ට ණය ලබාදීම සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමට 2002 වර්ෂයේදී රු.මිලියන 48 ක් ද, 2009 වර්ෂයේදී රු. මිලියන 50 ක් ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණද 2020 වර්ෂය දක්වාම ණය ලබාදීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු වටිනාකම රු. මිලියන 160.4 ක් වූ අතර සාමාන්‍ය ඉතුරුම් පොලියටත් වඩා අඩු සියයට 4 ක පොලියක් යටතේ මෙම අරමුදල් දීර්ඝකාලයක් බැංකුවේ රඳවා තැබීම අනාර්ථික කටයුත්තක් වී තිබුණි. | මෙම අරමුදල බී හා සී කලාපවල ජනපදිකයන් හා වෙන් කල අරමුදලක් බැවින් එම කලාපවල සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහනදායි පොලි අනුපාතයක් යටතේ ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට 2020 .09.01 බැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලැබී ඇත. ඒ අනුව බී හා සී කලාපවල ව්‍යවසායකයන් නගා සිටුවීම සඳහා එම අරමුදල භාවිතා කිරීමට සැලසුම් කර ඇත. | මුදල් කාර්යක්ෂමව සහ ඵලදායීව උපයෝජනය කල යුතුය. |

## 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු. මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 152 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 1,920 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. | එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි කිරිමට මූලික කටයුතු කරමින් පවතී. | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 6 සහ 7 වගන්ති | අධිකාරිය විසින් ආදායම් බදු ගෙවිය යුතු වුවත් ආදායම් බදු ගෙවා නොතිබුණු අතර ආදායම් බද්දෙන් නිදහස් බව සනාථ කිරීමට අවශ්‍ය ලේඛණ විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තවද සුළු | කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය වලට අදාල රාජ්‍ය භාග ආදායම සම්බන්ධයෙන් වූ රඳවා ගැනිමේ බදු (withholding tax) ලංකා විදුලි බල | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | |
|---|---|---|
| | පරිමාණ ජල විදුලි බලාගාරවලින් උපයන රාජ්‍ය භාග ආදායම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.36,823,372 ක රඳවාගැනීමේ බද්දක් ගෙවා තිබුණද ඒ සඳහා වන බදු අඩුකිරීමේ සහතික පත් ලබාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් අනාගතයේදී ආදායම් බද්දට යටත් වුවහොත් බදු සහනය ලබා ගැනීමට නොහැකි වීමේ තත්ත්වයක් පැවතුණි. | මණ්ඩලය මගින් අයකර ඇත. |

**02.** මූල්‍ය සමාලෝචනය

----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵලය

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 293,175,000 ක අලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 423,600,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 130,425,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රාජ්‍ය භාග ආදායම් වැඩිවීම සහ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03.** මෙහෙයුම් සමාලෝචනය

--------------------------

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ගොවිපළවල්වල පවතින සංවර්ධනය නොකල උස් බිම් පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම උදෙසා දීර්ඝකාලීන බදු පදනමින් වෙන්දේසි කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2019 ජුනි 18 දින ලබා දී තිබුණි. ඒ අනුව එම ගොවිපළවල් සතු සංවර්ධනය නොකළ උස්බිම් ඉදිරි මහ කන්නයේදී වගා කළ හැකි පරිදි වෙන්දේසි කිරීමට කටයුතු කරන ලෙස අදාල නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වෙත දන්වා තිබුණි. නිරාවිය, නොච්චියාගම සහ කලංකුට්ටිය ගොවිපලවල් සතු එකතුව හෙක්ටයාර් | නොච්චියාගම ගොවිපල භූමියෙන් අක්කර 43 ක කොටසක් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය පරිදි භුක්තිය භාරදී ඇත. බැහැර කරන ලද ඉඩම් කොටස මිනුම් කිරීමට ජොෂ්ඨ මිනුම්දෝරු අධිකාරි අනුරාධපුර වෙත යොමු කර ඇත. කලංකුට්ටිය ගොවිපල භූමියෙන් අක්කර 25 ක බිම් කොටසක් භාරදීමට කටයුතු සූදානම් කර ඇත. නිරාවිය ගොවිපල භූමියේ සංවර්ධනය නොකරන බිම් කොටස සුදුසු ආයෝජකයකු ඉදිරිපත් විමෙන් පසු විධිමත් ලෙස බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි වෙන්දේසි ක්‍රමය මඟින් තරගකාරීව සහ විනිවිදභාවයෙන් යුතුව මිල ගණන් කැඳවා ඉඩම් බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 53.4 ක් වූ උස් බිම් 2020 පෙබරවාරි වන විටත් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. එම ගබඩා වී ගබඩා කිරීමට ප්‍රමිතගත පරිදි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බැවින්, එම ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙන මෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද එම ඉඩම් පැවැරීමට හෝ බදු මුදල් අයකර ගැනීමට 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අපොහොසත්වී තිබුණි. | අධිකාරිය විසින් කලාපවල පදිංචි කරන ලද ඉඩම් ලාභින් වෙත ලෝක ආහාර වැඩසටහන යටතේ ලබා දුන් ආහාර ගබඩා කිරීම සඳහා ඉදි කරන ලද ගබඩාවේ. එම වැඩසටහන අවසාන වීමෙන් පසු එම ගබඩා වී ගබඩා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය වෙත ලබා දී ඇත. ඒ අනුව වී අලෙවි මණ්ඩලය විසින් ඔවුන් භාවිතා කරන මෙම ගබඩා විධිමත් පරිදි ඔවුන් වෙත පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව වී අලෙවි මණ්ඩලය විසින් ඉල්ලනු ලබන වී ගබඩා සම්බන්ධ තොරතුරු අදාල කලාප වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇත. එම තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තක්සේරු වටිනාකම අය කර ගැනිමේ පදනම මත වී අලෙවි මණ්ඩලය වෙත විධිමත් පරිදි පවරා දීමට කටයුතු කරනු ලැබේ. | ගබඩා කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර අදාල කුලී මුදල් අයකර ගත යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් ජී.එස්.එම්.බී. තාක්ෂණ සේවා ( පුද් ) සමාගම සමඟ 2019 අප්‍රේල් මස මාස 6 ක් සඳහා ගිවිසුම් ගත වී කන්තලේ සූරියපුර තුම්මෝදර වැලි නිධියෙන් වැලි කියුබ් 103,128 ක් ඉවත්කර රු.61,876,800 ක ආදායමක් ඉපයීමට අපේක්ෂා කර තිබුණද 2019 දෙසැම්බර් 31 වන විට උපයා තිබුණේ රු.12,969,960 ක ආදායමක් පමණි. ගිවිසුමේ 4 වගන්තිය ප්‍රකාරව ලබාගෙන තිබුණු රු. 30,000,000 ක බැංකු ඇපකරය 2019 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණද 2020 අගෝස්තු 19 වූ විගණිත දිනය වනවිටත් ඇපකරයේ කාලය දීර්ඝකරගෙන නොතිබුණි. ඒ | ගිවිසුම අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට ඉවත් කිරීමට අපේක්ෂිත වැලි කියුබ් ප්‍රමාණය කියුබ් 103,128 වූ අතර ඒ සඳහා රු: 61,876,800 ආදායමක් අපේක්ෂා කරන ලදී. නමුත් මෙම ව්‍යාපෘතිය සඳහා පැමිණි විරෝධතා හේතුවෙන් වැලි ඉවත් කිරීමේ කටයුතු වලට ප්‍රථමව ගංවතුර ආරක්ෂණ වේල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම සිදු කරන ලදී. එමෙන්ම ප්‍රාදේශීය වැලි ව්‍යාපාරිකයින් හා සිවිල් සංවිධාන හා ගොවි සංවිධාන මගින් ඇති කළ විරෝධතා හේතුවෙන් 2019 ජුලි 08 වන දිනය වන විටත් වැලි කැණීම ආරම්භ කිරීමට | අපේක්ෂිත ආදායම් ලබාගත හැකි පරිදි කටයුතු කල යුතු අතර ගිවිසුම අනුව ලබාගත් බැංකු ඇපකරවල කාලය දීර්ඝ කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවට ඉදිරි මාසයේ වැලි කැනීම් කියුබ් **24,000** ක් සඳහා රු.**14,400,000** ක මුදලක් ලබාගෙන ගිවිසුම නැවත අළුත් කර තිබුණි. | නොහැකි වී ඇත. මුළු ව්‍යාපෘති කාලය තුල ඉවත් කරන ලද වැලි කියුබ් **39206.04** ක ප්‍රමාණය ඉවත් කර ඇති අතර ඒ සඳහා රු: **23,523,624** ගාස්තුව අයකර ඇත. ගිවිසුමේ අංක **04** ප්‍රකාරව වැලි නිධිය කැණීම් ආරම්භ කිරීමට ප්‍රථම ඉදිරියේදී කැනීම් කරනු ලබන වැලි කැණීම් සඳහා ඉඩම් පරිහරණ ගාස්තු වශයෙන් ගෙවිය යුතු ගාස්තුවට සුරක්ෂාවක් ලෙස රු: මිලියන **30,000** ක බැංකු ඇපකරය තැන්පත්කර ඇත. ඉවත් කර ඇති වැලි කියුබ් ප්‍රමාණය සඳහා ගාස්තු නිවැරදිව ගෙවීම් කරන ලද බවට නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ තහවුරුව අනුව බැංකු ඇපකරය නිදහස් කර ලබා දෙන ලදී. භූමියේ පුනරුත්ථාපනය වෙනුවෙන් ඇපකරයක් තබා ගැනීම පිළිබඳව ගිවිසුම්ගතව නොමැති අතර, භූමියේ පුනරුත්ථාපනය ව්‍යාපෘතිය අවසානයේ දී උපදේශන කමිටුවේ අනුමැතියට යටත්ව සිදුකල යුතු බව ගිවිසුම් අංක **14** යටතේ දක්වා ඇත. | |
| (ආ) | **2018** වර්ෂයේ මැයි සිට විදුලි ජනනය සිදු කර තිබුණු මොරගහකන්ද ජල විදුලි බලාගාර තුනේ ආදායම් **2019** වර්ෂයේ අධිකාරියේ ආදායම් ඇස්තමේන්තුවලට ඇතුලත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල එම බලාගාර වලින් රු. මිලියන **647** ක් උපයා තිබුණි. විදුලි බලාගාරවල නඩත්තු වියදම් සඳහා අරමුදලක් ඇතිකර නොතිබුණු අතර ආදායමෙන් කිසිදු ප්‍රතිපාදනයක් හෝ සිදු කර නොතිබුණි. ඉන් රු. මිලියන **200** ක් **2019** දෙසැම්බර් **31** දිනට අධිකාරියේ අතැති බිල්පත් ගෙවීම සඳහා නැවත ලබාගැනීමේ පදනමින් රජයේ ආදායමට බැර කර තිබුණද සෙසු මුදල් අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. | **2018** වර්ෂයේ මැයි සිට විදුලිය ජනනය කලද **2019** වර්ෂයට අදාල **2018** දෙසැම්බර් මාසයේ ඇස්තමේන්තු සකස් කිරිම සිදු කරයි. ඒ වන විට මේ සම්බන්ධ අදාල විස්තර අප වෙත වාර්තා වී නොතිබුණි. එබැවින් එම ආදායම් ඇස්තමේන්තුව කිරිමට නොහැකි විය. විදුලිබලාගාර නඩත්තු සඳහා මෙම අරමුදලින් කොටසක් වෙන් කිරිම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබු බැවින් ඉදිරියේ දී අදාල අංශ දැනුවත් කර ප්‍රතිපත්තියක් සකස් කිරිමට කටයුතු කරමින් පවති. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා අධිකාරියේ ආදායම භාවිතා කල හැකි බැවින් ඒ අනුව අදාල වියදම් සිදු කර ඇත. | සියළුම අපේක්ෂිත ආදායම් ඇතුලත් කර අයවැය ලේඛනය සකස් කළ යුතු අතර ඇස්තමේන්තු කර නොතිබුණු සියළු ආදායම් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තලාව කඳවුරු භූමියෙන් **40** දෙනෙකුගෙන් යුත් තේරීම්ලාභී ලැයිස්තුවක් සඳහා ඉඩම් ලබාදීමට සැලසුම් කර තිබුණද **43** දෙනෙකු වෙනුවෙන් ඉඩම් මැනුම් කරවාගෙන තිබුණි. මුල් තේරීම්ලාභී ලැයිස්තුවේ නම් සඳහන් නොවූ පස් දෙනෙකු වෙත ඉඩම් මැනුම් කර තිබුණු අතර මුල් තේරීම්ලාභි ලැයිස්තුවේ **2** කු වෙත ඉඩම් මැනුම් කර නොතිබුණි. තලාව කඳවුරු භූමියේ මහවැලි අධිකාරියේ සේවය කරන නිලධාරීන් **44** දෙනෙකු සඳහා ඉඩම් කැබලි භාරදී තිබුණු අතර, විගණිත දිනය වූ **2020** ජූලි **07** දක්වාම එම ඉඩම් විධිමත්ව අදාල තේරීම්ලාභීන් වෙත බැහැර කර නොතිබුණි. ඉන් ඉඩම් කට්ටි **15** ක් අවිධිමත්ව අන්සතු කර තිබුණද අනවසර භුක්තිය ඉවත්කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ඉඩම් තේරීම්කර වර්ෂ **12** කට අධික කාලයක් ගත වී තිබුණද එක් ඉඩමක් හැර ඉතිරිය නේවාසික කටයුතු සඳහා භාවිතා කර නොතිබුණු අතර ඉඩම් වල් බිහි වී තිබුණි. | තලාව කොට්ඨාසයේ **420/421**ඒකකයේ තලාව මහවැලි කඳවුරු භූමිය තුල මහවැලි අධිකාරියේ සේවය කරන ලද නිලධාරි **44** දෙනෙකු **H/EX/33** හා **H/171** යන අනුරේඛනයට හා **H/EX/45** යන අනුරේඛනයට අනුව **44** දෙනෙකු සඳහා **2009** වර්ෂයේ දී භාර දී ඇත. මුල් තේරීම් ලේඛනයේ නම සටහන් නොවූ **05** දෙනෙකු සඳහා ඉඩම් **2003** වර්ෂයේ පවත්වා ඇති තේරීම් ලේඛනය පදනම් කරගෙන භාර දී ඇත. කැ.සි. **110135** පත්‍ර අංක **26** හි මූලික සිතියමට අනුව බිම් කැබලි **51** ක් වෙන් කර ඇති අතර, එම **44** දෙනාට එම කැබලි භාර දී ඇත. තවද මෙම ඉඩම් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දී ඇති බැවින් සම්පූර්ණ තක්සේරු මුදල් ගෙවා අවසන් වන තුරු ඔවුන් වෙත නිදහස් දීමනා පත්‍ර ලබාදීමට හැකියාවක් නොමැති බව දන්වමි. සටහනට අනුව ඉඩම් කට්ටි වලින් **1571, 1582, 1588, 1598, 1600, 1572, 1591, 1573, 1606, 1554, 1549, 1548,1578** හා **1545** යන ඉඩම් කට්ටි අවිධිමත් ලෙස අන්සතු කර ඇති අතර එම ඉඩම්වල මුල් ඉඩම් ලාභියාගෙන් අවලංගු කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි. මෙම ඉඩම් ලාභීන් වෙනත් කලාපවල සේවය කිරීම කරන බවත්, ඉඩම් ලාභීන් වෙනත් ප්‍රදේශවල පදිංචි වීම හා ඔවුන් මෙම ඉඩම් සංවර්ධනය කර නොමැති වීමත් නිසා මෙම ඉඩම් සංවර්ධනය කරන ලෙසට හා හිඟ බදු මුදල් ගෙවන ලෙසත් ලිඛිතව දන්වා ඇත. | අනවසර භුක්තිය ඉවත් කිරීමට කටයුතු කළ යුතු අතර ඉඩම් නේවාසික කටයුතු සඳහා යොදා නොගන්නේ නම් තේරීම්ලාභීත්වය අවලංගු කළ යුතුය. |
| (ඇ) | තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශය තුල පිහිටි කළුගල් කැනීම් බලපත්‍ර **8** ක නියැදි පරීක්ෂාවේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත කළුගල් කියුබ් **75,973.8** ක් සඳහා රාජ්‍ය භාගය ගෙවා තිබුණද මහවැලි අධිකාරියේ තඹුත්තේගම නේවාසික | තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමණාකාර බලප්‍රදේශය තුල පිහිටි කලුගල් කැණීමේ ව්‍යාපෘති සඳහා බැහැර කර ඇති ඉඩම් අතරින් කැණීම් බලපත්‍ර **08** කට අදාල ව්‍යාපෘති වලින් ඉඩම් පරිහරණ ගාස්තු අයකර ඇති කියුබ් ප්‍රමාණය **8369.5** ක් බව දක්වා ඇත. අදාල | කැනීම් බලපත්‍ර සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉවත්කර ඇති කළුගල් ප්‍රමාණයන් නිශ්චිතව ගණනය කර අදාල ඉඩම් පරිහරණ ගාස්තු අයකල යුතුය. |

| | | |
|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් ගාස්තු අයකර තිබුනේ කළුගල් කියුබ් **8,369.5** ක් සඳහා පමණි. ඒ අනුව ඉපයිය හැකිව තිබුණු රු. **66,127,150** ක ආදායමක් අහිමි වී තිබුණි | නියැදින් ගණනය කිරිම සිදුකර ඇත්තේ එම ව්‍යාපෘති කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධිමත් අනුමැතිය ලද වර්ෂවල සිට වේ. නමුත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් ඉඩම් පරිහරණ ගාස්තු ගාස්තු අයකිරීම භූ විද්‍යා සමීක්ෂණ කාර්යාංශය වෙත ගෙවනු ලබන කැණීම් පරිමාව මත පදනම්ව සිදුකල යුතු බව **LUP/01/01/2019** චක්‍රලේඛය මගින් දක්වා ඇති අතර ඊට පෙර භාවිතා කරන ලද චක්‍රලේඛවල එසේ දක්වා නොමැත. ඒ අනුව වරින් වර නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ අනුව හා එම කියුබ් ප්‍රමාණයන් ගණනය කරනු ලැබ ඇත්තේ **4/cs/3/10/**පොදු යන චක්‍රලේඛය පදනම් කර ගෙනය. ඒ අනුව වෝටර් ජෙල් කි.ග්‍රෑ. **01** කින් කලුගල් කියුබ් **2.5** ක් නිස්සාරණය කරනු ලබන බව නිගමනය කෙරේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙතින් අදාල තොරතුරු ඉල්ලීම්කලද මේ දක්වා එම තොරතුරු මා වෙත ලැබී නොමැත. තොරතුරු ලද පසු එම හිඟ කියුබ් ප්‍රමාණයන්ට අදාලව ව්‍යාපෘතිකරුවන් වෙතින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු සිදුකරනු ලැබේ. | |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2017** වර්ෂයේ රු. **8,550,788** ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය සතු දොඹකර යන්ත්‍රයක් නිසි පරිදි අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් **2018** සිට **2020** මැයි දක්වා නිශ්කාර්යව පැවතුණි. | **2018** වර්ෂයේ දී අදාල හයිඩ්‍රොලික් පද්ධතිය අලුත්වැඩියාවන් කිරීමට බලාපොරොත්තු වුවත් මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමේ සීමාවන් නිසා ප්‍රතිපාදන නොලැබීමෙන් එම කාර්යය සිදු කර ගැනීමට නොහැකි විය. ඒ අනුව **2019** වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුමටද මෙම යන්ත්‍රයේ හයිඩ්‍රොලික් පද්ධතිය අලුත්වැඩියා වෙනුවෙන් මුදල් වෙන් කර ගැනීමට නොහැකි විය. **2020** වර්ෂයේ වැඩ සැලසුමට ද ඉල්ලීම් කර | නිසි පරිදි අළුත්වැඩියා කර භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තිබුණද මෙම වර්ෂයේ අතුරු සම්මත ගිණුම් හතරක් මගින් වෙන්කර තිබූ ප්‍රතිපාදන පෙර වර්ෂ වලටත් වඩා සීමා වූ බැවින් මෙම කාර්යය සිදු කර ගත නොහැකි විය. | |

**3.4** වයාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ පැරණි වේලි ආදර්ශනය ඉවත්කර තිබුණු අතර නව වේලි ආදර්ශනයක් සැකසීම සහ පවතින නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 වර්ෂයේ රු.6,990,000 කට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. රු.2,060,000 ක් වැය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු වේලි ආදර්ශනය 2020 මැයි වන විටත් අවසන් කර නොතිබුණි. | නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට යොමු කරනු ලැබේ. | නෛතික ක්‍රියාමාර්ග අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතුය. |

**3.5** ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ මිලදී ගත් වගකීම් කාලසීමාවද ඉක්මවා නොතිබුණු වායුසමීකරණ යන්ත්‍ර 21 ක් මිලදීගත් ආයතනය මගින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර භාවිතයෙන් ඉවත්කර එම ආයතනයෙන්ම සමාලෝචිත වර්ෂයේදී රු.3,367,971 කට වායුසමීකරණ යන්ත්‍ර 22 ක් නැවත මිලට ගෙන තිබුණි. එසේම මෙම මිලදීගැනීම් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කරද නොතිබුණි. | වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම වායු සමීකරණ යන්ත්‍රයක් ක්‍රියා විරහිත වූ විට එහි කලයුතු අලුත්වැඩියා, වැය වන මුදල, මිල දී ගෙන ඇති දිනය, යන්ත්‍රයේ වගකීම් කාලය තුලද, කම්ප්‍රෙෂරයේ වගකීම් කාලය තුල ද යනාදී කරුණු සියල්ල සලකා සුදුසු පරිදි නියෝජිත ආයතන වෙතින්, හෝ බාහිර ආයතනයකින් අලුත්වැඩියා කරවීමට හෝ අලුතින් සවිකිරිමට හෝ කටයුතු කල යුතු වේ. සමහර යන්ත්‍ර වසර 15-20 අතර කාලයක් කාර්මික දෝෂ හෝ ගැටළු නොමැතිව භාවිතා කල හැකි වේ. මේ තත්වය මත ප්‍රසම්පාදන සැලැස්මේ වර්ෂය තුලදී මිලදී ගන්නා වායු සමීකරණ සංඛාවක් සටහන් නොවන අතර පොදු නඩත්තු කටයුතු සඳහා වෙන් කර ඇති මුදල් මේ සඳහා උපයෝගි කරගනු ලැබේ. | වගකීම් කාලය තුල අළුත්වැඩියාවන් අදාල සැපයුම්කරු මගින් සිදුකරවාගත යුතු අතර ගුණාත්මක සහ ආර්ථික බවෙන් යුතු භාණ්ඩ සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.6** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද නිල නිවාසය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.4,861,105 ක කොන්ත්‍රාත් ගිවිසුමටකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු. 1,243,051 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් කාලය අවස්ථා 2 කදී 2018 දෙසැම්බර් 28 දක්වා දීර්ඝකර තිබුණද එදිනට වැඩ නිමකර නොතිබුණි. 2018 නොවැම්බර් 20 දින කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය අවසන් වී තිබුණද එහි වලංගු කාලය දීර්ඝකරගෙන නොතිබුණි. 2019 මාර්තු 14 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර ප්‍රමාද ගාස්තු රු.486,110ක් අයකරගෙන නොතිබුණි. කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවනලද රු.1,402,376 ක් 2020 අගෝස්තු 17 දින වන විටත් අයකරගෙන නොතිබුණි. කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 23 දින අදාල ආයතනය වෙත ප්‍රදානය කර ඇත. මෙහි දී කොන්ත්‍රාත් කාලය දින 150ක් වූ අතර මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු ඉහත නම සඳහන් කොන්ත්‍රාත් ආයතනය විසින් 2017 දෙසැම්බර් 05 දින ආරම්භ කර ඇත. කොන්ත්‍රාත් සමාගම වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් මුදලක් වශයෙන් රු.1,458,331 ක මුදලක් ඉල්ලා තිබුණ ද එයින් රු.1,243,051 ක අත්තිකාරම් මුදලක් 2017 දෙසැම්බර් 27 දින ගෙවා ඇත. ඉහත කොන්ත්‍රාත්තුවේ වැඩ ප්‍රමාද විම සම්බන්ධව 2018 මාර්තු 29 දිනැති ලිපිය මඟින් අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත දන්වා ඇත. කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2018 මැයි 06 දී අවසන් වීමට ඇති බැවින් කොන්ත්‍රාත්තුවට අදාල කාර්ය සාධන ඇපකරය හා වැඩ ආම්භ කිරිමේ අත්තිකාරම් ඇපකරය දීර්ඝ කිරිමට දැනුම් දී ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2018 සැප්තැම්බර් 15 දක්වා දීර්ඝ කර ඇත. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු අදාල දිනයට නිම කිරිමට නොහැකි විම නිසා 2018 ඔක්තෝබර් 10 දින දක්වා කොන්ත්‍රාත් කාලය දිර්ඝ කර දෙන මෙන් 2018 ජූලි 09 දිනැති ලිපිය මඟින් ඉල්ලීම් කර තිබුණ ද 2018 සැප්තැම්බර් 20 දින දක්වා පමණක් කොන්ත්‍රාත් කාලය දිර්ඝ කරන ලදී. 2018 ජූලි 23 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මෙම කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය 18% ක් තරම් වීම නිසා කොන්ත්‍රාත්කරුට හැකි ඉක්මණික් මෙම කටයුතු නිම කිරිමට උපදෙස් දෙන ලදි. 2018 නොවැම්බර් 21 දිනැති ලිපිය මඟින් මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය පිළිබඳ | කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණ ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සැහිමකට පත්විය නොහැකි බව ප්‍රධාන කාර්යාලය දැනුවත් කරන ලදි. එම ලිපියට අනුව ප්‍රධාන කාර්යාලය මඟින් කොන්ත්‍රාත්කරුට සති දෙකක් ඇතුලත වැඩ, නැවත ආරම්භ කිරීමට උපදෙස් දෙන ලදි. තවද **2019** පෙබරවාරි **07** දිනැති ලිපිය මඟින් කොන්ත්‍රාත්කරු වැඩ කටයුතු ආරම්භ කර නොමැති බව ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දී තිබේ. ඊට අනුව ප්‍රධාන කාර්යාලය මඟින් මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු අවලංගු කිරීම සිදු කර ඇත. තවද **2018** සැප්තැම්බර් **12** දිනැති ලිපිය මඟින් කොන්ත්‍රාත්තුවට ආදාල කාර්ය සාධන ඇපකරය හා අත්තිකාරම් ඇපකරය මුදල් අයකර ගැනීමට ඉදිකිරීම් ආරක්ෂක අරමුදල වෙත දැනුම් දී ඇත. | |
| (ආ) | රඹකැන්ඔය කලාපයේ මහඔය නිල නිවාසයක ඉදිකිරීමට **2017** වර්ෂයේ රු.**4,843,185** ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.**1,414,555** ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් **2019** මාර්තු **14** දින කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. කාර්යසාධන ඇපකරයේ හා අත්තිකාරම් ඇපකරයේ කාලය **2018** සැප්තැම්බර් **15** දින අවසන් වී තිබුණද ඒවායේ කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු රු. **1,242,997** ක මුදලක් **2020** අගෝස්තු **17** දින වන විටත් අයකරගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව **2017** නොවැම්බර් **14** දින අදාල ආයතනය වෙත රු.**4,843,185** ක මුදලකට ප්‍රදානය කරන තිබුණි. මෙහි කොන්ත්‍රාත් කාලය දින **150** ක් වූ අතර කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු **2017** දෙසැම්බර් **06** දින ආරම්භ කර තිබුණි. **2017** දෙසැම්බර් **17** දිනැති ලිපිය මඟින් අත්තිකාරම් මුදලක් වශයෙන් රු **1,417,556** මුදලක් ඉල්ලා තිබුණ ද එයින් රු. **1,414,556** ක මුදලක් පමණක් ගෙවා ඇත. ඉහත කොන්ත්‍රාත්තුවට අදාලව වැඩ කටයුතු ප්‍රමාද වීම නිසා **2018** මාර්තු **29** දිනැති ලිපිය මඟින් අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත දැනුම් දීමට කටයුතු කරන ලදී. කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වීම නිසා දින **50** කින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර දෙනලෙස ඉල්ලීම මත කොන්ත්‍රාත් කාලය **2018** සැප්තැම්බර් **20** දින දක්වා දීර්ඝ කරන ලදී. මෙම කොන්ත්‍රාත්තුවට අදාලව **2018** ජූලි **23** දින ප්‍රගති සමාලෝචන රැස්වීමේදි භෞතික ප්‍රගතිය **17%** ක පමණ වන බව දන්වා ඇත. එම නිසා ඉතා කඩිනමින් කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු අවසන් කර ලෙස දැනුම් දෙන ලදී. **2018** සැප්තැම්බර් **12** දිනැති ලිපිය මඟින් ඉදිකරීම් ආරක්ෂණ අරමුදල වෙත කාර්යය සාධන ඇපකර මුදල් අයකර | කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණ ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගන්නා ලෙස දැනුම් දී ඇත. ප්‍රධාන කාර්යාලය මඟින් 2018 දෙසැම්බර් 11 දිනැති ලිපිය මඟින් සති දෙකක් ඇතුලත මෙම කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු ආරම්භ කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී තිබේ. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු ආරම්භ කිරිමට නොහැකි වීම නිසා 2019 මාර්තු 14 දිනැති ලිපිය මඟින් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කල බව අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත දැනුම් දී ඇත. | |
| (ඇ) | රඹකැන්ඔය කලාපයේ කාමර 10 කින් සමන්විත සාද නිවාසයක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.13,837,634 කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. කාර්යසාධන ඇපකරයේ හා අත්තිකාරම් ඇපකරයේ කාලය 2019 පෙබරවාරි 28 දින අවසන් වී තිබුණද ඒවායේ කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ලබා දී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු. 1,311,158 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අංක: ICTAD/SBD/01 දරන ප්‍රකාශනයේ 59.2 වගන්තිය ප්‍රකාරව ඉංජිනේරුවරයාගේ අවසරයකින් තොරව දින 28 ක් පුරාවට වැඩ නවතා ඇති ඉදිකිරීමකට අදාලව කොන්ත්‍රාත්කරුගේ සේවය අවසන් කළයුතු වුවද අධිකාරිය විසින් 2020 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් කාලය අවස්ථා 05ක දී දීර්ඝ කර ඇති අතර 2019.01.31 දින දක්වා වලංගුව පැවතුනි. ඉහත කොන්ත්‍රාත්තුවට අදාලව අත්තිකාරම් ඇපකරය හා කාර්ය සාධන ඇපකරයේ වලංගු කාලය ද 2018 දෙසැම්බර් 28 දක්වා දිර්ඝ කර ඇත. මෙම කොන්ත්‍රාත්තුව සඳහා අදියර හතරක් යටතේ බිල්පත් ගෙවා ඇති අතර එම වටිනාකම රු. 8,179,315.00 ක් වේ. එම ගෙවීම් වලදී වැඩ ආරම්භක අත්තිකාරම් මුදලින් රු. 2,788,842.00 ක මුදලක් පියවා ගෙන ඇති අතර තව දුරටත් රු 1,311,158.00 ක් අය කර ගත යුතුව ඇත. මෙම ඉදිකිරීම් පිළිබඳව අදියර පරික්ෂා කිරීමේදී ලබා දී ඇති අත්තිකාරමට අදාල පියවා ගැනීමට හැකිවන පරිදි වැඩ කොටසක් ඔවුන් විසින් නිමවා ඇති බවට ද වැඩිදුරටත් දන්වමි. | කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ සේවය අවසන් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වලව කලාපයේ මුරවැසිහේන කොට්ඨාස කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් **2018** වර්ෂයේ රු. **14,757,550** කට ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.**4,323,015** ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් **2020** ජනවාරි **22** කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත නැවත සති **6** ක් කල් දී තිබුණි. **2020** අගෝස්තු **17** දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරුගෙන් රු.**3,150,256** ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයවිය යුතුව පැවතුණි. | මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු **2019** මැයි මස **25** වන දින අවසන් වීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ කටයුතුවල ප්‍රගතියක් නිරීක්ෂණය නොවීම නිසා ආයතනය වෙත ඒ සම්බන්ධ දැනුවත් කර **2019** ජූනි **06** දින ලිපියක් යොමු කර ඇත. **2019** සැප්තැම්බර් **20** වන දින ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල මගින් කාර්යසාධන බැදුම්කරය **2019** දෙසැම්බර් **31** වන දින දක්වා දීර්ඝ කර ඇත. **2019** මැයි මස **17** වන දින අවස්ථා **03** කදී සාධාරණ හේතුන් සලකා බලා **2019** නොවැම්බර් **30** වන දින දන්වා මෙම කොන්ත්‍රාත්තුවට කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. **2019** දෙසැම්බර් **05** වන දින ව්‍යාපෘතියේ වැඩ අත්හිටුවීම සඳහා අවසන් නිවේදනයක් යොමු කර ඇති අතර ඒ අනුව කඩිනමින් ව්‍යාපෘති සැලසුම් කර අවසන් කිරිමට කටයුතු යොදන ලෙස දන්වන ලදී. **2020** පෙබරවාරි **19** වන දින පැවති ප්‍රගති සමාලොචන රැස්වීමේ දී ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල හා කොන්ත්‍රාක්කරු සමග සාකච්ඡා කරගත් පරිදි සති **06**ක කාලයක් තුල වැඩ නිම කිරිමට එකග විය. තවද **2020** මැයි **14** වන දින කාර්යය සාධක ඇපකරය හා අත්තිකාරම් ඇපකරය අලුත් කිරිම සඳහා ආයතනය වෙත දන්වා යවන ලදී. ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරිම සඳහා ලිපියක් **2020** මැයි **14** වන දින ආයතනය වෙත යොමු කර ඇත. මෙම ව්‍යාපෘතියට අදාල අත්තිකාරම් ඇපකර හා කාර්යය සාධන ඇපකරය **2020** දෙසැම්බර් **31** වන දින දීර්ඝ කර ඊට අදාල ලියවිලි ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල මගින් මේ වන විට ලබා දී ඇත. | කාලය දීර්ඝකිරීම් තුල වැඩ අවසන් කර නොමැතිනම් ගිවිසුම අවසන් කර අදාල සුරක්ෂණ, මුදල් කරවාගත යුතු අතර කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 35 න් 16 ක් පුරප්පාඩුව පැවතුන අතර ඉන් 12 දෙනෙකු වැඩ බැලීම රාජකාරී ආවරණය, කොන්ත්‍රාත් කාර්යය පැවරුම් හා ද්වීතීයන පදනම මත පුරප්පාඩු තනතුරුවල රාජකාරී ඉටුකරගෙන තිබුණි. අධිකාරිය විසින් වරින් වර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණද බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැති බැවින්, පුරප්පාඩු දීර්ඝ කාලයක් පුරා සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබුණි. තවද, මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 148 ක් හා මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 349 ක් පැවතුණි. | 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ තනතුරු 35 න් 16ක් පුරප්පාඩු පැවතියද එම පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා අයදුම්පත් කැඳවා තිබුණ ද මැතිවරණ කාලසීමාව තුලදී බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට නොහැකි වීම මත ඉන් තනතුරු 12 ක් සඳහා වැඩ බැලීම, රාජකාරි ආවරණය,කොන්ත්‍රාත් පදනම මත කාර්යය පැවරුම් පදනම මත හා ද්විතීයන පදනම මත නිලධාරින් පත් කිරීමෙන් පුරප්පාඩු තනතුරුවල රාජකාරි අඛණ්ඩව ඉටුකර ගැනීමට කටයුතු කර ඇත. නැවතත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමණාරණ මට්ටමේ මධ්‍යම කළමණාකරණ මට්ටමේ හා මෙයෙයුම් කළමණාකරණ මට්ටමේ පුරප්පාඩු පවතින තනතුරු 54 ක් සඳහා අභ්‍යන්තරින් අයදුම්පත් කැඳවා ඇත. මෙම අයදුම්පත් කැඳවීමේ දී මුලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සඳහා සම්මුඛ පරීක්ෂණ කඩිනමින් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව කාරුණිකව වැඩිදුරටත් දන්වමි. එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමත් සමඟ දන්වා ඇති ගැටළුකාරි තත්ත්වය විසදෙනු ඇති බව කාරුණිකව දන්වමි. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා ස්ථිර නිළධාරීන් බඳවා ගත යුතුය. |

### 3.8 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය සතු වාහන 11 ක් බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. 2016 වර්ෂයෙන් පසු වාහන අපහරණය කිරීමක් සිදුකර නොතිබුණු අතර අපහරණය කළ යුතු වාහන නිසි අවස්ථාවේදී අපහරණය නොකිරීම නිසා වාහන 64 ක් රු.1,577,100 ක තක්සේරු මුදලකට සුන්බුන් ලෙස අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. | වසර 35 කට වඩා පැරණි මෙම වාහන වල පවතින දෝෂයන් නිසා (වැසි දිරාපත් වීම පැස්සුම් සහිත වීම හා ඇඳවීම්) මහා මාර්ගයේ ධාවනය කල නොහැකිව ගරාජය තුල ගාල් කර ඇති බැවින් වාහනයක් ලෙස අපහරණය නොකර සුන්බුන් ලෙස අපහරණයට තීරණය කර ඇත. එසේම 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් | බාහිර පාර්ශව වෙත ලබා දී ඇති වාහන නැවත අධිකාරිය වෙත ලබා ගත යුතු අතර නිසි අවස්ථාවේදී වාහන අපහරණ කටයුතු සිදුකල යුතුය. |

කළමනාකරණ වක්‍රලේඛයේ 1.3.3 වගන්තිය අනුව මෝටර් රථ දෙපාර්තමේන්තුවේ සාමාජිකයෙකු සැම කලාපයකටම ලබා දීම ප්‍රමාද වීම නිසා නිසි අවස්ථාවේ දී අපහරණ කටයුතු සිදු කිරීම කල නොහැකි විය. ඉදිරියේ දී මෙවැනි තත්වයන් ඇති නොවීමට කටයුතු කරනු ලැබේ.